කල්මුනේ මහනගර සභාව

අම්පාර දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන .

1.1 . මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2012 ජනවාරි 05 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 05 දින ඉදිරිපත් කරන ලදි . වර්ෂය සඳහා වූ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2012 පෙබරවාරි 28 දින මහනගර සභාවේ නගරාධිපතිවරයා වෙත නිකුත් කරන ලදි .

1.2 . මතය .

ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , සභාපතිවරයා වෙත යවන ලද මාගේ වාර්තාවේ දක්වා ඇති මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ කල්මුනේ මහනගර සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර පිළියෙල, 2010 දෙසැම්බර් 31 දිනට කල්මුනේ මහනගර සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සහ පිළිබඳව සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2 . මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය .

2.1 මූල්‍ය ප්‍රතිඵල .

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු . 10,453,272 ක් වූ අතර එයට එයට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු . 5,100,429 ක් විය .

## 2 . 2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම .

නගරාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම , තථ්‍ය ආදායම සහ හිග ආදායම පහත දැක්වේ .

| | ආදායම් විෂයය . | ඇස්තමේන්තුගත . | තථ්‍ය . | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිග ආදායම |
|---|---|---|---|---|
| | | රු . 000 | රු . 000 | රු. 000 |
| i | වරිපනම් සහ බදු | 10,909 | 2,728 | 12,313 |
| ii | කල්බදු | 12,586 | 9,713 | 3,171 |
| iii | බලපත්‍ර ගාස්තු | 2,387 | 1,675 | - |
| iv . | වෙනත් ආදයම් | 50,510 | 58,244 | - |

### 2.2.2 උසාවි දඩ

මහේස්ත්‍රාත් උසාවි මගින් රැස් කරන ලද රු. 1,081,858 ක් වූ උසාවි දඩ අයකර ගෙන පළාත් ආදායම් කොමසාරිස්වරයා වෙත ප්‍රේෂණය කිරිමට කටයුතු කර නොතිබුණි .

### 2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු. 24,235,519 ක් වූ මුද්දර ගාස්තු ලැබී නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සඳහා මහනගර සභාවේ අයවැයගත වියදම, තථ්‍ය වියදම සහ විචලනයන් පහත දැක්වේ .

| වියදම් විෂයය | අයවැයගත | තථ්‍ය | විචලනය |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | රු. 000 | රු. 000 | රු. 000 |
| පුද්ගල පඩිනඩි | 49,569 | 39,589 | 9,980 |
| වෙනත් | 17,685 | 35,609 | (17,924) |
| උප එකතුව | 67,254 | 75,198 | (7,944) |
| ප්‍රාග්ධන වියදම් | 9,140 | 1,864 | 7,276 |
| මුළු එකතුව | 76,394 | 77,062 | (668) |

2.4 . මානව සම්පත් කළමනාකරණය .

අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය .

මහනගර සභාවේ 2010 දෙසැම්බර් 31 දිනට අනුමත සහ තථ්‍ය කාර්යය මණ්ඩලය පහත දැක්වේ

| තනතුරු වර්ගය . | අනුමත . | තථ්‍ය . |
|---|---|---|
| මාණ්ඩලික ශ්‍රේණිය | 07 | 03 |
| ද්විතියික ශ්‍රේණිය | 62 | 58 |
| ප්‍රාථමික ශ්‍රේණිය | 105 | 94 |
| වෙනත් | - | 77 |
| | 174 | 232 |

2.5 . වත්කම් කළමනාකරණය .

අයකරගත යුතු සේවක ණය .

2010 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු සේවක ණය ශේෂයන්ගේ එකතුව රු . 5,645,203 ක් වූ අතර එයින් වර්ෂය ඉක්ම වූ ගිණුම්වල එකතුව රු . 2,880,003 ක් විය.

2.6 . අභ්‍යන්තර විගණනය .

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි .

3 . පද්ධති හා පාලන .

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

( අ ) ගිණුම්කරණය .

( ආ ) ස්ථාවර වත්කම් පාලනය .

( ඇ ) ආදායම් පරිපාලනය .